සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය
எனது இல
**My No** } DDD/HO/04/07
Samurdhi Village

ඔබේ අංකය
உமது இல
**Your No** }

දිනය
திகதி
**Date** } 2016.09.05

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත.

**දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/11 - I**

**සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන**

උක්ත වැඩසටහන සම්බන්ධයෙන් ඔබ වෙත මගේ සමාංක අංක හා 2016.07.29 දිනැතිව එවා ඇති දිවිනැගුම චක්‍රලේඛ අංක 2016/11 සහ 2016.09.02 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. මෙම වැඩසටහනට 2016 වසර සඳහා ජීවනෝපාය හා අලෙවි අංශයන් යටතේ ඔබ වෙත එවා ඇති සමස්ථ ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රමුඛතාවයන් අනුව ඕනෑම අංශයක/ ක්ෂේත්‍රයක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කළ හැකිය.

03. තවද 2016/06 චක්‍ර ලේඛය අනුව සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක "දිවි සවිය ගම්මාන" වැඩසටහනෙහි ඔබ දිස්ත්‍රික්කයෙන් තෝරාගත් ගම්මානය සඳහා රු. 1,024,000/- ක මුදලක් මේ වන විට ලබාදී ඇති අතර එම මුදලින් මෙතෙක් කටයුතු ආරම්භ කර නොමැති ව්‍යාපෘති සඳහා වෙන්ව ඇති මුදල් ද ඔබ දිස්ත්‍රික්කයේ අළුතින් තෝරාගත් සමෘද්ධි ආදර්ශ ගම්මානයේ නිවාස හා වැසිකිළි පහසුකම් ලබාදීමේ ව්‍යාපෘති සඳහා යොදවන ලෙස දන්වමි. මීට අමතරව එම සමෘද්ධි ආදර්ශ ගම්මානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ සංවර්ධන පදනම සතු අරමුදල් යොදවා ගනිමින් අවශ්‍යතාවය අනුව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්නේ නම් මැනවි.

04. ආදර්ශ ගම්මානයේ කසල කළමනාකරණ ව්‍යාපෘති හා පරිසර සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවගේ දායකත්වය මෙන්ම පෞද්ගලික අංශයේ අනුග්‍රාහක දායකත්වය ලබා ගැනීමට සුදුසු පියවර ගන්නා ලෙසත් මෙම සියළු කටයුතු වලදී අදාල පළාත් පාලන ආයතන සහ රජයේ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරගනිමින් ක්‍රියා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

j/jee/Ban./L.H.N.2016

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
011-2883802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
Fax -011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர்(நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax -011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
**011- 2887722(Hotline)**

05. හඳුනාගන්නා ලද ව්‍යාපෘති ප්‍රමුඛතාවය අනුව කඩිනමින් ක්‍රියාත්මක කිරීමටත්, නිමකරනු ලබන වැඩ කොටස් අනුව ගෙවීම් කිරීම මඟින් වසර අවසානය වන විට අත් මුදල් ලබා ගැනීම පිළිබඳ ගැටළු මඟ හරවා ගැනීමටත් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. එබැවින් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්නේනම් මැනවි.

06. මේ සමඟ ඒවා ඇති ආකෘතිය යොදාගනිමින් සෑම සති දෙකකට වරක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ( මාසයේ 15 දිනට හා අවසන් දිනට) ෆැක්ස් අංක 011-2872201, divinegumalh@yahoo.com මඟින් මා වෙත එවිය යුතු බව ද කාරුණිකව දන්වමි.

07. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු නිලධාරීන් දක්වන සහයෝගය ඉතා අගය කරමි.



චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා -කා.දැ.ගැ.ස.
2. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.ස.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස.
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
7. අතිරේක ලේකම් (දිවිනැගුම), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස.
8. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස.
10. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස.
11. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
12. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් - අ.ක.ස. හා දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා